''ගමේ උදාව දැයේ උදාවයි"

සීමාසහිත .....

.....

සර්වෝදය ශ්‍රමදාන සමිතියේ රීති

සර්වෝදය ශ්‍රමදාන සමිතියේ රීති

පූර්විකාව

ලංකා ජාතික සර්වෝදය ශ්‍රමදාන සංස්ථාපිත සංගමයේ දර්ශණය ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග කෙරෙහි පැහැද එම සංගමය විසින් අප ගමෙහි/ නගරයෙහි ගමෙහි, නගරයෙහි මෙහෙයවන ලද ග්‍රාමෝදය/ නගරෝදය සේවාවනට සහභාගි ව විවිධ සර්වෝදය හවුල්වලට අයත් අපි, ලංකා ජාතික සර්වෝදය ශ්‍රමදාන සංස්ථාපිත සංගමයේ උපදෙස් පරිදි අප ගමෙහි, නගරයෙහි සර්වෝදය ග්‍රාමෝදය, නගරෝදය කටයුතු ඉදිරියටත් වඩා වගකීමකින් යුතුව පවත්වාගෙන යාමෙහි අභිලාශයෙන් සංවර්ධනයක් ලෙස පහත සඳහන් රීතී වලට යටහත්ව මෙයින් සංවිධාන වන්නෙමු.

1. වන රීතිය - නාමය

සමිතියේ නාමය සීමාසහිත .....
සර්වෝදය ශ්‍රමදාන සමිතිය විය යුතු අතර මෙහි මින් මතු "සමිතිය" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

2. වන රීතිය - ලාංඡනය

පසුබිමෙහි උදාවන හිරු සහිතව ලා රන් පැහැති පිපුණු නෙළුම් මල සමිතියේ ලාංඡනය වන්නේය.

3. වන රීතිය - ආදර්ශ පාඨය

"ගමේ උදාව දැයේ උදාවයි " යන්න සමිතියේ ආදර්ශ පාඨය වන්නේ ය.

4. වන රීතිය - ධජය

ධවල පසුබිමක සමිතියේ නාමය, ලාංඡනය හා ආදර්ශ පාඨය සහිත ධජයක් සමිතියට තිබිය යුතු ධජය වන්නේය.

5. වන රීතිය - සමිතියේ කාර්යාලය

සමිතියේ කාර්යාලය ..... ගමෙහි/

නගරයෙහි පවත්වා ගෙන යා යුතුය. .....
.....
.....

6 වන රීතිය - පොදු පරමාර්ථ

පහත දැක්වෙන පොදු පරමාර්ථ සමිතියේ පොදු පරමාර්ථ වන්නේ ය. ලංකා ජාතික සර්වෝදය ශ්‍රමදාන සංස්ථාපිත සංගමයේ දර්ශනය පොදු පරමාර්ථ, පොදු ප්‍රතිපත්ති සහ සංවර්ධන වැඩ සටහන් ..... ගමේ/නගරයේ සීමා ප්‍රදේශය තුළ ජනතාවට අවබෝධ කර දීම, ස්වශක්තිය හා සාමූහිකත්වය ගොඩනැංවීම සහ සහභාගීත්වයෙන් ඒවා ක්‍රියාත්මක කිරීම.

(ii) ..... ගමේ/නගරයේ සීමා ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන විවිධ සර්වෝදය හවුල් වලට අවශ්‍ය මඟ පෙන්වීම සහ සමායෝජනය ලබාදීම.

(iii) පහත දැක්වෙන මූලික මානුෂික අවශ්‍යතා සපුරාලීමෙහි ලා ප්‍රතිපත්ති සහ සැලසුම් සෑදීම, ඒවා ක්‍රියාත්මක කිරීම සහ ප්‍රතිඵල ඇගයීම සම්බන්ධයෙන් අවශ්‍ය නායකත්වය සැලසීම.
(අ) පරිසරය (ආ) ජලය (ඇ) ඇඳුම් (ඈ) ආහාර (ඉ) නිවාස (ඊ)සෞඛ්‍යය (උ) සංනිවේදන (ඌ) ඉන්ධන (එ) අධ්‍යාපන (ඒ) සංස්කෘතික සහ අධ්‍යාත්මික අවශ්‍යතා

(iv) ගමේ නගරයේ සහ අවට ගම්වල නගරවල ක්‍රියාත්මක වන සර්වෝදය හවුල්, සර්වෝදය ශ්‍රමදාන සමිති, ග්‍රාමෝදය මධ්‍යස්ථාන, සර්වෝදය අධ්‍යාපන ආයතන සහ වෙනත් සර්වෝදය ආයතන සමඟ ද සර්වෝදය මූලස්ථානය සමඟ ද සම්බන්ධතා පවත්වන ආයතනය වශයෙන් ක්‍රියා කිරීම සහ

(v) ගමේ සංවර්ධනය සහ රජයෙන්, පළාත්පාලන ආයතන වලින්, වෙනත් දේශීය මහජන ආයතන වලින්, රාජ්‍ය සංස්ථා වලින් සහ පෞද්ගලික මට්ටමින් ලබාගත හැකි ආධාර සහ සේවා ලබා ගැනීම.

(vi) සමිතියේ සුභ සාධක වැඩ පිළිවෙලවල්, ව්‍යාපෘති හා කටයුතු රක්ෂා ඇති කරලීමේ ද ඒ සුභසාධක වැඩ පිළිවෙලවලින්, ව්‍යාපෘති වලින් හා කටයුතු වලින්ම මුදල් උත්පාදනය කර ඒවා පවත්වාගෙන යාමේ ද, කාර්යය සඳහා සමිතියේ බලප්‍රදේශය තුළ ආර්ථික හා මූල්‍ය ප්‍රවර්ධනය කිරීම හා සංවිධානය කිරීම ඒවායේ නිරත වීම සහ ඒ කටයුතු කරගෙන යාම.

(vii) සමිතියේ බලප්‍රදේශ තුළ කර්මාන්ත දිරි ගැන්වීමෙහි ප්‍රවර්ධනය කිරීම හා දියුණු කිරීමෙහිලා සහය වීම.

(viii) දේශීය කාර්මික හා කෘෂිකාර්මික නිෂ්පාදනය විදේශීය වෙළඳ පොළවලට නිර්යාත කිරීම දිරි ගැන්වීම.

(ix) ගමේ කාර්මික හා කාෂිකාර්මික දියුණුව ඇති කිරීම සඳහා අවශ්‍ය හෝ හිතකර වන්නා වූ හෝ යම් යම් පියවර, ගම් අතර කාර්මික, කෘෂිකාර්මික හා වෙළෙඳ ක්ෂේත්‍රයෙහි හා ජාතික මට්ටමින් ගැනීමෙහි ලා සහාය වීම.

(x) ප්‍රාග්ධන, ණය, වෙළෙඳ පොළ, කළමනාකාරීත්ව හා කාර්මික අපහසුතා ද, නීතිමය උපදෙස් ද සැලසීම ඇතුළුව ගමෙහි ක්‍රියාත්මක වන යම් කාර්මික හෝ කෘෂිකාර්මික ව්‍යවසායකට හෝ ව්‍යාපෘතියකට අවශ්‍ය සෑම විස්තරයකට ම අයත් සේවා හා පහසුතා සැපයීම, සහ

(xi) මේ රීතියෙහි සඳහන් පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමෙහි ලා අවශ්‍ය විය හැකි හෝ හිතකර විය හැකි හෝ සියලු පියවර ගැනීම.

7 වැනි රීතිය - පොදු ප්‍රතිපත්ති

සමිතියේ සාමාජික සාමාජිකාවන් විසින් පහත සඳහන් පොදු ප්‍රතිපත්ති දහය පිළිපැදීමට උත්සහ දැරිය යුතු ප්‍රතිපත්ති ලෙස පිළිගනු ලැබේ.

i සෑම අවස්ථාවක දීම සත්‍ය, අහිංසාව සහ ආත්ම්‍යභරණය පිළිපැදීම.

ii සමිතියේ පාරිශුද්ධිය ආරක්ෂා කරවීමේ අභිප්‍රායෙන් පක්ෂ දේශපාලන සම්බන්ධතා ඇතිකර නොගැනීම.

iii චාම් දිවි පැවැත්මක අරමුණු ක්‍රමයෙන් ඉටුකර ගැනීම.

iv පෞද්ගලික ධන හිමිකම්, තරඟය, වෛරය, තෘෂ්ණාව මුල් කොට ඇති වර්තමාන ජීවන ක්‍රමය වෙනුවට පොදු අයිතිය, සහයෝගය, දයාව සහ ආත්ම පරිත්‍යාගය මත ගොඩනැගුණු සර්වෝදය සමාජ ක්‍රමයක් අහිංසාවාදී මාර්ග වලින් ගොඩනැංවීමට උත්සාහ කිරීම.

v අපේ සංස්කෘතික උරුමයන් වූ මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා යන සතර බ්‍රහ්ම විහරණයන් ද, දාන ප්‍රිය වචන, අර්ථ චර්යා හා සමානාත්මතා නම් වූ සතර සංග්‍රහ වස්තූන් මුල් කොටගත් ධාන්‍යාගාරයක් සහ ධර්මද්වීපයක් බවට ශ්‍රී ලංකාව පරිවර්තනය කිරීම සඳහා කැපවීම.

vi සමිතියේ පරමාර්ථ ඉෂ්ඨ කර ගැනීම සඳහා උපයෝගී කර ගන්නා මාර්ග යහපත් හා පිරිසිදු ඒවා විය යුතු බව පිළිගැනීම.

vii සාමාජිකත්වය ලබා ඇති අය විධායක මණ්ඩලයේත්, වැඩිහිටි මණ්ඩලයේත් තීරණවලට කීකරු විය යුතු බව පිළිගැනීම සහ ඒ තීරණ වලින් යම් සාමාජිකයෙකුට සාමාජිකත්වය අහිමි බව ප්‍රකාශ වන්නේ නම් සිය කැමැත්තෙන් ඉල්ලා අස්වීම තමන් ගන්නා එකම පියවර බවට ප්‍රතිඥා දීම.

viii සාමාජික, සදාචාරාත්මක, දේශපාලනමය හා ආර්ථික වශයෙන් සම්පූර්ණ අහිංසාවාදී විප්ලවයක් ගමෙහි නගරයෙහි ඇති කිරීමෙහි ලා සමිතිය විසින් ගත් පළමු පියවර ශ්‍රමදානය බව අවබෝධ කරගෙන යුක්තිය සහ සමානාත්මතාව ප්‍රධාන ලක්ෂණ කොට කවර අන්දමේ හෝ පෙලීම් වලින් තොර සර්වෝදය සමාජ ක්‍රමයක් බිහි කිරීම සඳහා කාලෝචිතව ගන්නා සෙසු සර්වෝදය පියවර සහ ක්‍රියාමාර්ග ගැන සැලකිලිමත්ව සේවය කිරීම.

ix විද්‍යාඥානය හා අධ්‍යාත්මික ගුණ වගාව සමතුලිත ලෙස එක්වන ග්‍රාමීය හා නාගරික ප්‍රජාවන්ගෙන් සෑදුනු නිදහස් ජන රජයන් රටවල් තුළ ඇති වීම ද සාමය, සහයෝගය හා ජාතීන්ගේ නිදහස පදනම් වූ එක්සත් ජාතීන්ගේ පොදු රාජ්‍ය මණ්ඩලයක් ලෝකයේ ඇති වීම ද ලෝක සාමය සහ මනුෂ්‍ය සංහතියේ උපරිම සතුට ළඟාවෙන මාර්ගය බව අවබෝධ කර ගෙන ඒ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වැර වැඩීම සහ

x ගමේ/නගරයේ විවිධ සර්වෝදය හවුල් වලට ආදර්ශමත් වන පරිදි සමඟිව රැස්ව සමඟිව සාකච්ඡා කොට සමඟිව තීරණ වලට එළඹ, සමඟිව සමිතියේ කටයුතු නිමවා විසිර යාමේ ප්‍රතිපත්තිය පිළිපැදීම.

8 වන රීතිය - ප්‍රතිඥාව

i සමිතියේ සාමාජිකත්වය, අපේක්ෂා කරන සෑම දෙනාම සමිතියට බැඳීමේ දී පහත දැක්වෙන ප්‍රතිඥාව දිය යුතුය.

ii සමිතියේ සෑම වාර්ෂික මහා සභා රැස්වීමක දීම සාමාජිකයන් විසින් සාමුහිකව මේ ප්‍රතිඥාව අළුත් කරගත යුතුය.

iii මාගේ සාමාජිකත්වය හා විනය පිළිබඳ සියලුම ප්‍රශ්නවල දී සමිතියේ විධායක මණ්ඩලයේ සහ වැඩිහිටි මණ්ඩලයේ තීරණ අවසාන තීරණ වශයෙන් පිළිගන්නා බවට මෙයින් ප්‍රතිඥා දෙමි. තවද සමිතියේ නීති රීති අනුව මාගේ සාමාජිකත්වය හෝ මා දරණ නිලතල හෝ යම් විටක දී මට අහිමි වූ නම් ඒ හේතුවෙන් මට කිසිම පෞද්ගලික හානියක් හෝ කැලලක් සිදුවූයේ යයි නොසලකන අතර, මා අතින් සිදු වූ ප්‍රමාද දෝෂ හා ප්‍රතිපත්ති පැහැර හැරීම ආදී දුර්වලකම් වලින් මිදී නැවත යම් දිනක සාමාජිකත්වය ලබා ගැනීමට සුදුස්සකු වීමට ද ප්‍රතිඥා දෙමි.

9 වන රීතිය - සාමාජිකත්වය

i සමිතියේ සාමාජිකත්වය ..... දින .....වන අතර එය

(අ) .....ගමේ/ නගරයේ පදංචි වයස අවුරුදු 7 සම්පූර්ණ කළ කවර හෝ සර්වෝදය හවුලකට අයත් යම් සාමාජිකයෙකුට හෝ සාමාජිකාවකට, සහ

(ආ) ජනතාව උදෙසා කරන ලද සේවය පිළිගැනීමක් වශයෙන් සමිතියේ විධායක මණ්ඩලය විසින් ආරාධිත සාමාජිකත්වය දැරීමට ආරාධනා කරනු ලබන පූජ්‍ය පක්ෂයට සහ රාජ්‍ය නිළධාරීන්ට විවෘතව ඇත්තේ ය.

ii සාමාජිකත්වය සඳහා නියමිත ආකෘතියෙහි වූ ඉල්ලුම් පත්‍රය සාමාජික මුදල සමඟ සමිතියේ ප්‍රධාන ලේකම් වෙත ලැබුණු විට ඒ ඉල්ලුම් කරුට සාමාජිකත්වය දීම පිළිබඳව විධායක මණ්ඩලය විසින් සලකා බලා තීරණය කරනු ලැබේ.

iii සාමාජිකත්වයට ඇතුලත් වීමෙන් පසුව එම සාමාජිකයන් විසින් සමිතියේ පරමාර්ථ සහ ප්‍රතිඥාව පිළිගන්නා ලදැයි සලකනු ලැබේ.

iv සමිතියේ සාමාජිකත්වයට ඇතුළත් කර ගැනීම, සාමාජිකත්වය දීම ප්‍රතික්ෂේප කිරීම, සාමාජිකත්වය අත්හිටුවීම සහ සාමාජිකත්වයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් සියලු බලතල සමිතියේ විධායක මණ්ඩලයට ඇත්තේය.

v සාමාජිකත්වය පිළිබඳ විනයානුකූල කටයුතු වලට අදාළ කරුණු වලදී සමිතියේ මහ සභා රැස්වීමට හෝ වෙනත් යම් පාර්ශ්වයකට හෝ ඒ තීරණ පිළිබඳව හේතු දැක්වීමට සමිතියේ විධායක මණ්ඩලය බැඳී නොමැති නමුදු විධායක මණ්ඩලය විසින් එම තීරණය ස්ථිර කරනු ලැබීම සඳහා සමිතියේ මහා සභා රැස්වීම ඉදිරියෙහි තැබිය යුතුය.

vi සාමාජිකත්වය ශ්‍රේණි පහක් වේ. එනම් ළමා සාමාජික යොවුන් සාමාජික, සාමාන්‍ය සාමාජික, යාවජීව සාමාජික සහ ආරාධිත සාමාජික යනුවෙනි.

vii වයස අවුරුදු 07 සම්පූර්ණ කළ එහෙත් අවුරුදු 14 සම්පූර්ණ නොකළ තැනැත්තන් ළමා සාමාජිකයන් යනුවෙන් ද, වයස අවුරුදු 14 සම්පූර්ණ කළ එහෙත් අවුරුදු 26 සම්පූර්ණ නොකළ තැනැත්තන් යොවුන් සාමාජිකයන් යනුවෙන් ද අවුරුදු 14 ඉක්මවා ඇති තැනැත්තන් සාමාන්‍ය සාමාජිකයන් යනුවෙන් ද මෙහි 10 (iv) වන රීතියෙහි නියම කර ඇති සාමාජික මුදල ගෙවන තැනැත්තන් යාවජීව සාමාජිකයන් යනුවෙන් ද 9 (1) රීතිය යටතේ ආරාධනා

ලබන තැනැත්තන් ආරාධිත සාමාජිකයන් යනුවෙන් ද හඳුන්වනු ලැබේ.

vii කිසිම සාමාජිකයෙකු පෞද්ගලික ස්වභාවයේ කිසිම ඵල ප්‍රයෝජනයක් ලැබීමට හිමිකම් නොලබන්නේය.

10 වන රීතිය - සාමාජික ගාස්තු

i ළමා සාමාජිකයකු වර්ෂයකට රුපියල් එකක් දායක මුදලක් වශයෙන් ගෙවිය යුතු වේ.

ii යොවුන් සාමාජිකයකු වර්ෂයකට රුපියල් හයක දායක මුදලක් වශයෙන් ගෙවිය යුතු වේ.

iii සාමාන්‍ය සාමාජිකයකු වර්ෂයකට රුපියල් විසිහතරක දායක මුදලක් ගෙවිය යුතු වේ.

iv එක්වර රුපියල් 240 ක් ගෙවන හෝ සාමාජිකත්වය ලැබූ දින සිට එක් අවුරුද්දක් ඇතුළත දී සමාන වාරික තුනක දී එකී මුදල ගෙවා සම්පූර්ණ කරන සාමාජිකයන් යාවජීව සාමාජිකයන් වශයෙන් සලකනු ලැබේ.

v 9 (i) (ආ) රීතියෙහි සඳහන් සාමාජිකයන් සාමාජික මුදල් ගෙවීමට බැදි නැති නමුදු ස්වකීය අභිමතය පරිදි සමිතියට පරිත්‍යාග කළ හැකි ය.

vi ළමා යොවුන් හා සාමාන්‍ය ශ්‍රේණිවල සාමාජිකයෝ සෑම අළුත් වර්ෂයකම නියමිත සාමාජික මුදල් එක් එක් ලිත් වර්ෂයේ ජනවාරි 31 වන දිනට පෙර ගෙවා තම සාමාජිකත්වය අලුත් කර ගත යුතුය.

vii සමිතියේ විධායක මණ්ඩලයේ තීරණයෙන් හෝ ඉල්ලා අස්වීමෙන් හෝ වෙනත් යම් මාර්ගයකින් හෝ ස්වකීය සාමාජිකත්වය අහිමිකර ගන්නා සාමාජිකයන්ට තමන් සාමාජිකත්වය දරමින් සිටි කාලය තුළ සමිතියට ලබා දුන් යම් දායක මුදලක් ආපසු ලබා ගැනීම පිණිස ඉල්ලා සිටීමට හිමිකම් නොමැත්තේය.

11 වන රීතිය - සාමාජික ලේඛණය

සාමාජිකයන්ගේ නම්, සාමාජිකත්ව, ශ්‍රේණිය, ස්ථිර ලිපිනය, සේවා ලිපිනය, සාමාජිකත්වය ලබාගන්නා ලද දිනය සාමාජිකත්වය අහිමි වූ දිනය සහ අවශ්‍ය යයි සමිතියේ ප්‍රධාන ලේකම් අදහස් කරන වෙනත් යම් අදාළ තොරතුරු ද දැක්වෙන සාමාජික ලේඛණයක් සමිතියේ ප්‍රධාන ලේකම්වරයා විසින් පවත්වා ගෙන යා යුතු ය.

12 වන රීතිය - විධායක මණ්ඩලය

i සමිතියේ වාර්ෂික මහා සභා රැස්වීමේ දී තෝරා ගන්නා ලද එක් එක් ශ්‍රේණියට අයත් සාමාජිකයන් 25 දෙනෙකුට නොවැඩි විධායක මණ්ඩලයක් මගින් සමිතියේ සියලු ක්‍රියාකාරකම් මෙම රීති වලට අනුකූලව පාලනය කළ යුත්තේය.

ii විධායක මණ්ඩලය පහත සඳහන් ආකාරයට සමිති සාමාජිකයින් අතුරින් තෝරා ගනු ලැබිය යුතු ය.

(අ) ළමා සාමාජිකයන් තිදෙනෙක්
(ආ) යොවුන් සාමාජිකයන් තිදෙනෙක්
(ඇ) සාමාන්‍ය සාමාජිකයන් අතුරින් මවුවරුන් තිදෙනෙක්
(ඈ) සමිතියේ මහා සභා රැස්වීමේ දී පූජ්‍ය පක්ෂය, සාමාන්‍ය ආරාධිත සහ යාවජීව සාමාජිකයන් අතරින් තෝරාගන්නා වැඩිහිටි මණ්ඩලයේ සාමාජිකයන් හත්දෙනෙක්, සහ
(ඉ) සාමාන්‍ය හෝ යොවුන් සාමාජිකයන් අතරින් තෝරාගනු ලබන තවත් සාමාජිකයන් නව දෙනෙක්.

iii සමිතියේ පොදු ප්‍රතිපත්තිවලට සහ පරමාර්ථ වලට පටහැනිව විධායක සභාවේ යම් සාමාජිකයකු ක්‍රියාකර ඇතැයි ළමා සාමාජිකයින් නොවන සමිතියේ සාමාජිකයින් දස දෙනෙක් අත්සන් කොට යෝජනාවක් ඉදිරිපත් වී ඇත්නම් ඉන්පසු කවර හෝ මහ සභා රැස්වීමක දී ඡන්දය දෙන සමිතියේ සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකක වැඩි ඡන්දයකින් විධායක මණ්ඩලයේ එම සාමාජිකයා සමිතියේ පොදු ප්‍රතිපත්ති වලට සහ පරමාර්ථ වලට පටහැනිව ක්‍රියා කිරීමේ හේතුව මත ස්වකීය ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය. ඒ සාමාජිකයා සම්බන්ධයෙන් ඒ සභා රැස්වීමේ දී ගනු ලබන තීරණය අවසාන තීරණය විය යුතු ය.

iv නව වර්ෂය වෙනුවෙන් පත්කරනු ලබන විධායක මණ්ඩලය ඊළඟ වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වෙන දිනය දක්වා සිය නිලවල කටයුතු කරනු ඇත.

13 වන රීතිය - විධායක මණ්ඩලයේ රීතිය

i සමිතියේ විධායක මණ්ඩලය අඩුම වශයෙන් එක් මාසයකට වරක් හෝ රැස්විය යුතුය.

ii විධායක මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා ගණ පූර්ණය සාමාජිකයන් එකොළොස් දෙනෙකි.

iii මහා සභා රැස්වීම අවසන් වූ දිනයෙහි ම විධායක මණ්ඩලයේ ප්‍රථම රැස්වීම පවත්වා වැඩිහිටි මණ්ඩලයේ සාමාජිකයින් නොවන විධායක මණ්ඩලයේ සෙසු සාමාජිකයින් අතරින් සමිතියේ සභාපති

ප්‍රධාන ලේකම් සහ භාණ්ඩාගාරික තෝරා ගනු ලැබිය යුතුය.

iv වැඩිහිටි මණ්ඩලයට අයත් විධායක මණ්ඩලයේ සාමාජිකයන් විධායක මණ්ඩලයේ රැස්වීම් වලදී ඡන්දය දීමෙන් වැළකී සිටිය යුතුය.

v සමිතියේ සාමාන්‍ය පරිපාලන කටයුතු පිළිබඳ සියලුම තීරණ ගැනීමේ බලය සමිතියේ සභාපති, ප්‍රධාන ලේකම් හා භාණ්ඩාගාරික සතුය.

vi විධායක මණ්ඩලය විසින් එකී මාසික රැස්වීම සඳහා මාසයේ සුදුසු දිනයක් නියම කර ගත යුතු ය.

vii පුර්ණ දින තුනකට කලින් ලිඛිතව දැනුම් දීමෙන් පසු විධායක මණ්ඩලයේ හදිසි රැස්වීමක් පවත්වනු ලැබිය හැකි ය.

viii සෑම විධායක මණ්ඩල රැස්වීමකදීම එහි සභාපති හෝ ඔහු නොමැති විටක විධායක මණ්ඩලය විසින් තෝරා ගනු ලබන වැඩිහිටි මණ්ඩලයේ සාමාජිකයකු හෝ රැස්වීමේ මුලසුන දැරිය යුතුය.

ix විධායක සභාවේ සෑම තීරණයක්ම වැඩි ඡන්දයෙන් තීරණය කළ යුතු අතර, සමාන ඡන්ද ගණනක් ඉදිරිපත් වූ අවස්ථාවක සභාපති තුමාගේ තීරක ඡන්දය තීරණයක් ගැනීම සඳහා පාවිච්චි කළ හැකි ය.

14 වන රීතිය - විධායක මණ්ඩලයේ බලතල හා කාර්ය කටයුතු

සමිතියේ විධායක මණ්ඩලය විසින් පහත දැක්වෙන බලතල කාර්ය හා කටයුතු ක්‍රියාත්මක කරවීම හා ඉටු කිරීම කළ හැකි ය.

i සමිතියට සාමාජිකයන් ඇතුළත් කර ගැනීම ඔවුන්ගේ සාමාජිකත්වය අත්හිටු වීම සහ අස් කිරීම වැනි සියලු කරුණු ලේකම්වරයාගේ යෝජනාවක් මත තීරණය කිරීම.

ii නිළධාරීන්ට කාර්ය වෙන්කර දීම සහ ඔවුන්ගේ විනය පාලනය සහ සේවය ඉවත් කිරීම ආදී බලතල ක්‍රියාත්මක කිරීම.

iii විධායක මණ්ඩලයේ හා වැඩිහිටි මණ්ඩලයේ සභාපති. ප්‍රධාන ලේකම් හා භාණ්ඩාගාරික යන ධූරවල ඇතිවන පුරප්පාඩු පිරවීම.

iv උප කමිටු පිහිටුවා ඒවාට කාර්ය නියම කිරීම හා ඒවා විසුරුවා හැරීම.

v ඒ ඒ සර්වෝදය හවුල් මඟින් කෙරෙන ග්‍රාමෝදය වැඩ කටයුතු සංවිධානය කිරීම සහ එම කාර්යවලදී මඟ පෙන්වීම.

vi පුර්ණ කාලීන සේවකයන්, පෙර පාසල් පාලිකාවන්, සෞඛ්‍ය සේවිකාවන්, පොදු මුළුතැන් ගෙවල් සේවිකාවන්, දාරකාගාර සේවිකාවන් සහ වෙනත් ග්‍රාමෝදය සේවක සේවිකාවන් අවශ්‍ය පරිදි පත්කිරීම හා අස් කිරීම, ඔවුන්ගේ විනය පාලනය සහ දීමනා හෝ ගාස්තු අනුමත කිරීම.

vii ප්‍රධාන ලේකම් මගින් සමිතියේ සියලුම ලිපි ලේඛනාදිය පවත්වා ගෙන යාම සහ ඒවා සුරක්ෂිතව තැන්පත් කොට තැබීම.

viii භාණ්ඩාගාරික මගින් සමිතියේ ගිණුම්, ආදායම් හා වැය පිළිබඳ ලිපි ලේඛණ පවත්වා ගෙන යාම සහ ඒවා සුරක්ෂිතව තැන්පත්කොට තැබීම.

ix සමිතියේ සියලුම ගිණුම් පරීක්ෂා කිරීම සඳහා සමිති ආඥා පනත යටතේ අනුමත කරන ලද විගණකවරුන් පත් කිරීම.

x එකී විගණනකරුවන් විසින් පරීක්ෂා කොට සහතික කරන ලද වාර්ෂික ගිණුම් වාර්තාව මහා සභා රැස්වීමට ඉදිරිපත් කිරීම.

xi සමිතියේ ප්‍රයෝජනය සඳහා ඉඩම්, ගොඩනැගිලි උපකරණ හෝ මුදල් පරිත්‍යාග වශයෙන් හෝ බැංකු ණය ආදී වෙනත් සුදුසු ක්‍රම මගින් අත්කර ගැනීම සහ සමිතියේ පරමාර්ථ උදෙසා ඒවා උපයෝගි කර ගැනීම සහ ආයෝජනය කිරීම.

xii ලංකා ජාතික සර්වෝදය ශ්‍රමදාන සංස්ථාපිත සංගමය ඊට අනුබද්ධ අනිකුත් ආයතන, අනිකුත් සර්වෝදය ශ්‍රමදාන සමිති රජයේ සහ රජයේ නොවන ආයතන සහ ප්‍රාදේශීය නිළධාරීන් සමඟ සුහඳ සම්බන්ධතා තහවුරු කර ගැනීම.

xiii සමිතියේ අරමුණුවලට අදාල පරිදි වෙනත් වැඩ සටහන් සංවිධානය කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම.

xiv සමිතියේ වාර්ෂික මහා සභා රැස්වීම සහ විශේෂ සහ සාමාන්‍ය මහා සභා රැස්වීම් කැඳවීමට ප්‍රධාන ලේකම්ට නියෝග කිරීම.

xv සමිතියේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමේ අදහස ඇතිව ගමේ කාර්මික හා කෘෂිකාර්මික සංවර්ධනයට අදාළ යම් කාර්මික කෘෂිකාර්මික හෝ වෙළෙඳ ව්‍යවසායක හෝ ව්‍යාපාරයක යෙදීම.

xvi සමිතිය විසින් ඉටු කරන ලද සේවා හෝ සපයන ලද පහසුතා හෝ උපකරණ සම්බන්ධයෙන් ගාස්තු හෝ වෙනත් අය කිරීම් අය කිරීම.

xvii සමිතියේ පරමාර්ථවල කාර්යය සඳහා අවශ්‍ය වන කිසිවක් ඉදිකිරීම, නිෂ්පාදනය කිරීම, මිළ දී ගැනීම හා පවත්වා ගෙන යාම.

xviii සමිතියේ පරමාර්ථවල කාර්යය සඳහා අවශ්‍ය විය හැකි සියලු ගිවිසුම්වලට හෝ එකඟ වීම් වලට කෙලින්ම හෝ සමිතිය විසින්

හෝ ඒ සඳහා දෙනු ලැබූ සමිතියේ යම් නිලධරයෙකු හෝ අනු යෝජිතයකු හෝ මගින් හෝ එළඹීම හා ඒ ගිවිසුමේ එකඟවීම ඉටු කිරීම හෝ ක්‍රියාත්මක කිරීම.

xix සමිතියේ පරමාර්ථවල කාර්යය සඳහා බැංකු මූල්‍ය ආයතන ණය දෙන සමිති වලින් හෝ වෙනත් යම් තැනැත්තෙකුගෙන් ණය මුදල් ලබා ගැනීම.

xx ගමේ පවත්වා ගෙන යනු ලබන යම් කාර්මික හෝ වෙළෙඳ ව්‍යවසායක්, ව්‍යාපෘතියක් හෝ කටයුත්තක් සඳහා සමිතියේ සාමාජිකයෙකුට හෝ වෙනත් තැනැත්තෙකුට ණය මුදල් දීම හා

xxi සමිතියේ පරමාර්ථ නිසි ලෙස ඉටු කර ගැනීම හා විධායක මණ්ඩලයේ බලතල හා කාර්ය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය යයි විධායක මණ්ඩලයේ අභිමතය වන වෙනත් සියලු ක්‍රියා කිරීම.

15 වන රීතිය - වැඩිහිටි මණ්ඩලය

යම්කිසි කාරණයක දී තීරණයකට එළඹීමට විධායක මණ්ඩලය අපොහොසත් වන අවස්ථාවක, ඒ කාරණාව වැඩිහිටි මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඒ පිළිබඳව වැඩිහිටි මණ්ඩලය විසින් ගනු ලබන තීරණය විධායක මණ්ඩලය විසින් පිළිගෙන ඒ අනුව ක්‍රියා කළ යුතුය.

16 වන රීතිය - සභාපති

සභාපති විසින්

i සමිතියේ සියලු කටයුතු පරීක්ෂා කිරීම සහ මෙහෙය වීම ද

ii විධායක මණ්ඩලයේ තීරණ මහා සභා රැස්වීම් වලට ඉදිරිපත් කිරීම ද කළ යුතු ය.

17 වන රීතිය - ප්‍රධාන ලේකම්

ප්‍රධාන ලේකම් විසින්

i වාර්ෂික හා අනිකුත් මහා සභා රැස්වීම් සහ විධායක මණ්ඩලයේ රැස්වීම් කැඳවීම, සමිතියේ සහ විධායක මණ්ඩලයේ වාර්තා පවත්වා ගෙන යෑම සමිතියේ ලියකියවිලි අත්සන් තැබීම සහ විධායක මණ්ඩලය විසින් තමා වෙත පවරනු ලබන වෙනත් කාර්ය ඉටු කිරීම.

ii සමිතියේ මුද්‍රාව ඔප්පු තිරප්පු සහ වෙනත් සියලුම වැදගත් ලිපි ලේඛණතම ආරක්ෂා භාරයේ තබා ගැනීම සහ

iii සෑම වර්ෂයකම ජුනි 30 වන දිනට පෙර සමිතියේ නව නිළධාරි මණ්ඩලයේ නම් සහ ලිපිනයන්ද, සාමාජික ලේඛණය ද සමිති රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කිරීම කළ යුතු ය.

18 වන රීතිය - භාණ්ඩාගාරික

භාණ්ඩාගාරික විසින්

i සමිතියට අයත් සියලුම මුදල්වල ආරක්ෂා භාරය තබා ගැනීම සහ ඒ මුදල් විධායක මණ්ඩලයේ විධාන පරිදි විය පැහැදම් කිරීම.

ii ලැබීෑ හා ගෙවීම් පිළිබඳ නිසි පොත්පත් ක්‍රමවත්ව පවත්වාගෙන යාම.

iii සමිතියට අයත් සියලුම මුදල් විධායක මණ්ඩලය විසින් පිළිගත් බැංකුවක අනිවාර්යයෙන්ම තැන්පත් කිරීම සහ ඒ මුදල් අවශ්‍ය පරිදි සමිතියේ කටයුතු සඳහා පරිහරණය කිරීම.

iv සමිතියට අයත් සියලු මුදල් විධායක මණ්ඩලය විසින් පිළිගත් බැංකුවක අනිවාර්යයෙන්ම තැන්පත් කිරීම සහ ඒ මුදල් අවශ්‍ය පරිදි සමිතියේ කටයුතු සඳහා පරිහරණය කිරීම.

v සමිතියේ ගිණුම්. සමිති ආඥාපනත යටතේ පිළිගත් විගණකවරයෙකු ලවා පරීක්ෂා කරවා ඔහු විසින් සහතික කරන ලද වාර්ෂික ගිණුම් වාර්තාව විධායක මණ්ඩලයට සහ මහා සභාවට ඉදිරිපත් කිරීම සහ

vi සමිති ආඥාපණත යටතේ පිළිගත් විගණකවරයෙකු ලවා පරීක්ෂා කරන ගිණුම් වාර්තාව ද එම ගිණුම් පරීක්ෂා කළ බවට නිකුත් කරනු ලබන ගිණුම් පරීක්ෂකගේ සහතිකය ද, අය අරමුදල්, බඩු බාහිරාදිය සහ වැය පිළිබඳව විස්තර ද ජුනි 30 වන දිනට පෙර සමිති රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කිරීම ද කළ යුතුය.

19 වන රීතිය - උප කමිටු පත්කිරීම.

i අවශ්‍ය සෑම අවස්ථාවකම පහත සඳහන් අන්දමේ කාර්ය සඳහා උප කමිටු පත් කිරීමට විධායක මණ්ඩලයට බලය තිබිය යුතුය.

(අ) ශ්‍රමදාන කඳවුරු, අධ්‍යාපනික සම්මන්ත්‍රණ, ඉතිරි කිරීම හා ණය ගනුදෙනු, පොදු වෙළඳ සැල්, ප්‍රදර්ශන, ළමා සුභසාධක කටයුතු අධ්‍යාපන ගමන්, ගස් සිටුවීමේ ව්‍යාපාර, ගෙවතු වගා ව්‍යාපාර සහ ආර්ථික සංවර්ධන ව්‍යාපෘති වැනි කාර්යයන්

(ආ) සාමාජිකයකු විසින් කරන ලදැයි චෝදනා නගන ලද වැරදි හැසිරීම් පිළිබඳව හෝ ධුර දරන්නකු සමිතියේ දේපල අයථා ලෙස පරිහරණය කළේ යයි හෝ පැමිණිලි ඇති වූ විට ඒවා විභාග කිරීම, සහ

(ඇ) සමිතියේ පරමාර්ථවලට අනුකූලව වෙනත් කාර්යයන්

ii උප කමිටුවකට අඩුම වශයෙන් විධායක මණ්ඩලයේ සාමාජිකයන් අතරින් තුන් දෙනෙකු හෝ ඇතුළත් විය යුතු අතර, සෙසු අය සාමාජිකයන් අතුරින් පත්කර ගනු ලැබිය හැකි ය.

iii අවශ්‍ය විටක යම් උප කමිටුවක් විසුරුවා හැර ඒ වෙනුවට අලුත් උප කමිටුවක් පත් කිරීමට විධායක මණ්ඩලයට බලය ඇත්තේ ය.

20 වන රීතිය - සමිතියේ මහා සභා රැස්වීම

i පහත දැක්වෙන පරිදි මහා සභා රැස්වීම වර්ග තුනක් වේ. එනම්, වාර්ෂික මහා සභා රැස්වීම, සමිතියේ විධායක මණ්ඩලයේ අනමතය හා තීරණය පරිදි හෝ සභාපති විසින් හෝ කැඳවනු ලබන විශේෂ මහා සභා රැස්වීම හා සාමාන්‍ය මහා සභා රැස්වීම් යනුවෙනි.

(අ) වාර්ෂික මහා සභා රැස්වීමේ වැඩ සටහනට ප්‍රධාන ලේකම්ගේ හා භාණ්ඩාගාරිකගේ වාර්ෂික වාර්තාව කියවා අනුමතය කිරීම සහ ඉදිරි වර්ෂයට විධායක මණ්ඩලයක් තෝරා ගැනීම ඇතුලත් වේ.

(ආ) සමිතියේ විධායක මණ්ඩලයේ අනුමැතිය හා තීරණය පරිදි පවත්වනු ලබන විශේෂ මහා සභා රැස්වීම් වැඩ සටහනෙහි රීති සංශෝධනය කිරීම, ප්‍රතිශෝධනය කිරීම හෝ රීති මාලාවට අලුත් රීති එකතු කිරීම යන මේවා පමණක් ඇතුළත් වේ.

(ඇ) සමිතියේ සාමාජිකයන් 25 දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් විසින් සභාපති වෙත ලිඛිතව ඉදිරිපත් කැරෙන ඉල්ලීමක් මගින් ඉදිරිපත් කරනු ලබන විශේෂ කාරණයක් පිළිබඳ තීරණයක් ගැනීම පිණිස සභාපති විසින් කැඳවනු ලබන විශේෂ මහා සභා රැස්වීමේ වැඩ සටහනට එසේ ඉදිරිපත් කැරෙන කාරණය පමණක් ඇතුළත් වේ.

(ඈ) සභාපති විසින් හෝ සමිතියේ විධායක මණ්ඩලය විසින් හෝ අවශ්‍ය යයි අදහස් කරනු ලබන පරිදි පවත්වනු ලබන සාමාන්‍ය මහා සභා රැස්වීම්වල වැඩ සටහනට සාකච්ඡාවට භාජනය කළ යුතු වැදගත් කරුණු ඇතුළත් වේ.

ii වාර්ෂික මහා සභා රැස්වීම් අගෝස්තු 31 වන දිනට පෙර පැවැත්විය යුතු ය.

iii සියලුම මහා සභා රැස්වීම් වල මූලාසනය සමිතියේ සභාපති විසින් දැරිය යුතු ය. කවර හෝ හේතුවක් නිසා සභාපති පැමිණ නොමැති නම් සභාව විසින් තෝරා ගනු ලබන වැඩිහිටි මණ්ඩලයේ සාමාජිකයෙක් මූලාසනය දැරිය යුත්තේය.

iv සියලුම මහා සභා රැස්වීම් සඳහා ගණ පූර්ණයට සාමාජිකයන් 50 දෙනෙකු නැතහොත් සාමාජික පිරිසෙන් තුනෙන් දෙකක් වන සාමාජික සංඛ්‍යාවක් සිටිය යුතු ය.

v සමිතියේ සෑම ශ්‍රේණියකම සාමාජිකයන් මහා සභාවල සාමාජිකත්වයට සුදුස්සන් වන අතර ඔවුනට ඒවාට සහභාගි වීමට හිමිකම් ඇත්තේය.

vi සියලුම මහා සභා රැස්වීම් සඳහා යටත් පිරිසෙයින් දින දහ හතරකට කලින් දැනුම් දීමක් සාමාජිකයන් වෙත කළ යුතු ය.

21 වන රීතිය - සමිතියේ අරමුදල්

i සමිතිය සතු අරමුදලක් තිබිය යුතු ය.

ii මෙම අරමුදලට

(අ) සාමාජික මුදල් සහ පරිත්‍යාග වශයෙන් ලැබෙන ආධාර මුදල්

(ආ) ලංකා ජාතික සර්වෝදය ශ්‍රමදාන සංස්ථාපිත සංගමය මගින් දෙනු ලබන ආධාර මුදල්

(ඇ) රජය මගින් හෝ ප්‍රාදේශීය ආයතන මගින් හෝ රජයේ නොවන වෙනත් දේශීය ආයතන මගින් දෙනු ලබන ආධාර

(ඈ) සමිතියට අයත් නිශ්චල හා චංචල දේපල වලින් ලැබෙන ආදායම සහ

(ඉ) වෙනත් දේශීය මාර්ග වලින් ලැබෙන ආදායම හර කරනු ලැබිය යුතුය.

iii මෙම අරමුදලින් ¦

(අ) සමිතියේ විධායක මණ්ඩලය විසින් ස්වකීය කටයුතු කිරීම සහ සේවා ඉටු කිරීමෙහි ලා යම් වැය ශීර්ෂයක් යටතේ වියදම් කළ යුතු මුදල්

(ආ) සමිතියේ සේවක පිරිස් සඳහා අවශ්‍ය දීමනා

(ඇ) නිළධාරීන් සහ අනිකුත් ස්වේච්ඡා සේවකයින් විසින් සමිතියේ යම් යම් කටයුතු සඳහා කරන වියදම්

(ඈ) තැපැල් ගාස්තු, විදුලි පණිවුඩ ගාස්තු, දුරකථන ඇමතුම්, ලිපිද්‍රව්‍ය සහ මුද්‍රණ කටයුතු සඳහා කරන වියදම්

(ඉ) විධායක මණ්ඩලය මගින් වෙන් කොට ඇති මුදලකින් පුණ්‍යාධාර සඳහා කෙරෙන ගෙවීï

(ඊ) විගණන සඳහා වූ ගාස්තු

(උ) කාර්යාලීය සහ අනෙකුත් බඩු බාහිරාදිය මිලට ගැනීම සඳහා අවශ්‍ය මුදල් ගනු ලැබිය යුතු ය.

iv සමිතියට ලැබෙන සියලුම මුදල් සීමා සහිත .... සර්වෝදය ශ්‍රමදාන සමිතිය නමින් සමිතියේ විධායක මණ්ඩලය පිළිගත් බැංකුවක තැන්පත් කළ යුතු අතර, චෙක්පත් සමිතියේ නිළධාරීන් දෙදෙනෙකු විසින් අත්සන් කළ යුතු ය. එයින් එක් නිළධාරියකු සමිතියේ භාණ්ඩාගාරික විය යුතු අතර, අතික් නිළධාරියා සමිතියේ සභාපති හෝ ප්‍රධාන ලේකම් විය යුතු ය.

v හදිසි වියදම් වශයෙන් භාණ්ඩාගාරික විසින් රු.....ට නොවැඩි මුදලක් තම භාරයේ තබා ගත හැකිය.

22 වන රීතිය - සමිතියේ පොත්පත්, ලිපි ලේඛණ ආදිය පරීක්ෂා කිරීමට ඇති බලය

සමිතියේ ප්‍රධාන ලේකම් වෙත දින තුනකට කලින් කරනු ලබන ලිඛිතව දැනුම් දීමකින් පසුව. සමිතියේ ඕනෑම සාමාජිකයකුට සමිතියේ පොත්පත් ලේඛණ ආදිය පරීක්ෂා කිරීමට බලය ඇත්තේය.

23 වන රීතිය - විගණනය

වාර්ෂික ගිණුම් පරීක්ෂණය සඳහා සමිති ආඥාපණත යටතේ අනුමත විගණකවරුන් සමිතියේ විධායක මණ්ඩලය විසින් පත් කරනු ලැබිය යුතුය.

24 වන රීතිය - නඩු පැවරීමට හා නඩු පවරනු ලැබීමට ඇති බලය

සමිතියට නඩු පැවරීමට බලය ඇති අතර, නඩු පවරනු ලැබීමට ද සමිතිය යටත් වන්නේ ය. එවැනි අවස්ථාවක් උද්ගත වූ විට සභාපතිට සහ ප්‍රධාන ලේකාිට සමිතිය වෙනුවෙන් ඉදිරිපත් වීමට බලය තිබේ. එසේම විධායක මණ්ඩලයේ තීරණය පරිදි ඒ කාර්යය සඳහා විධායක මණ්ඩලයේ වෙනත් සභිකයකු ඉදිරිපත් කිරීමට ද විධායක මණ්ඩලයට බලය ඇත්තේය.

25 වන රීතිය - සමිතියේ මුදල් වර්ෂය

සමිතියේ මුදල් වර්ෂය අප්‍රියෙල් මස පළමු වන දිනයෙන් ආරම්භ වන දොළොස් මාසයේ කාල පරිච්ඡේදය විය යුතු ය.

26 වන රීතිය - සමිතියේ දේපළ

යම් මිළට ගැනීමක්, ප්‍රදානයක් යථායෝග්‍ය ආධාරයක් තෙස්තමේන්තුවකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් සමිතිය සතු වන්නා වූ චංචල හා නිශ්චල කවර දේපලක් වුව ද භාර ගැනීමටත්, දැරීමටත් ඒවා සමිතියේ පරමාර්ථ ඉෂ්ඨ කර ගැනීම සඳහා ප්‍රයෝජනයට ගැනීමටත් සමිතියට බලය තිබිය යුතු අතර, සමිතියේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ බලය ද සමිතියට තිබිය යුතු ය.

27 වන රීතිය - සමිතියේ මුද්‍රාව

විධායක මණ්ඩලය මගින් තීරණය කරනු ලබන මුද්‍රාවක් සමිතියට තිබිය යුතු ය. මුද්‍රාව සමිතියේ ප්‍රධාන ලේකම් භාරයේ තිබිය යුතු ය. සමිතියේ සභාපති. ප්‍රධාන ලේකම් හා භාණ්ඩාගාරික යන නිලධාරීන් තිදෙනාගෙන් දෙදෙනෙකු ඉදිරිපිට දී මිස මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, ඒ නිලධාරීන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට සාක්ෂියක් වශයෙන් ඒ සාධන පත්‍රයට ස්වකීය අත්සන් තැබිය යුතුය.

28 වන රීතිය - රීති සංශෝධන කිරීම.

i සමිතියේ රීති සංශෝධන කිරීම. පරිවින්න කිරීම හෝ සංශෝධනය කිරීම. ඒ කාර්යය සඳහා කැඳවනු ලබන විශේෂ රැස්වීමකදී ඒ යෝජිත සංශෝධන වලට පක්ෂව දෙන සමිතියේ ඡන්ද හිමිකම් ඇති සාමාජික සාමාජිකයන්ගේ හතරෙන් තුනකට නොඅඩු ඡන්දයෙන් හා ඊට දින 14 කට නොඅඩු හා මාසයකට නොවැඩි දිනකදී නැවත බහුතරයේ අනුමැතියෙන් විය යුතුය.

ii ඒ ප්‍රතිශෝධන, පරිච්ඡින්න කිරීම හෝ සංශෝධන සමිතියට ලේකම් විසින් හෝ ඔහු පැමිණ නොමැති විටක ඒ රැස්වීමේ මූලාසනය දරණ තැනැත්තා විසින් හෝ ඒ විශේෂ මහා සභා රැස්වීමේදී යෝජනා කරනු ලැබිය යුතු ය.

29 වන රීතිය - අර්ථ නිරූපනය

මේ රීති මාලාවේ යම් රීතියක් අර්ථ නිරූපණය කිරීම සම්බන්ධයෙන් යම් මත භේදයක් පැන නැගුණහොත් එය සමිතියේ ලේකම් මගින් විධායක මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එහි ලා විධායක මණ්ඩලය විසින් දෙනු ලබන අර්ථ නිරූපනය අවසානාත්මක වන්නේය. ඒ අර්ථ නිරූපනය පිළිගෙන ඒ අනුව ක්‍රියා කිරීමට සෑම සාමාජිකයෙකුම බැඳී සිටින්නේය.

30 වන රීතිය - සාමාජික ආරාවුල්

සමිතියේ කටයුතු හෝ ක්‍රියාකාරීත්වය හෝ සම්බන්ධයෙන් සමිතිය හා එහි සාමාජිකයන් අතර, යම් ආරවුලක් උද්ගතවුවහොත් එය සමිතියේ ලේකම් මගින් විධායක මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එහි ලා විධායක මණ්ඩලය විසින් දෙනු ලබන තීරණය අවසානාත්මක වන්නේ ය. ඒ තීරණය කිසිම අධිකරණයක ප්‍රශ්න කරනු නොලැබිය යුතු අතර, ඒ තීරණ පිළිගෙන ඒ අනුව ක්‍රියා කිරීමට ඒ සාමාජිකයෝ බැඳී සිටින්නාහ.

31 වන රීතිය - සමිතිය විසුරුවා හැරීම

කවර හෝ හේතූන් නිසා සමිතිය විසුරුවා හරිනු ලැබුවහොත් යම්කිසි බැංකුවක සමිතියේ නමින් තැන්පත් කොට ඇති මුදල් ද ඇතුළු සමිතිය සතු සියලු චංචල හා නිශ්චල දේපළ, සමිතියේ සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික ධූර තත් කාලයේ දරණ නිලධරයන් විසින් ලංකා ජාතික සර්වෝදය ශ්‍රමදාන සංස්ථාපිත සංගමයේ විධායක මණ්ඩලය විසින් තත්කාර්ය සඳහා බල පවරනු ලබන වෙනත් යම් තැනැත්තකු හෝ තැනැත්තන් වෙත පවරා දෙනු ලැබිය යුතුය.

20..... ක් වූ ..... මස .....
වන දින ..... යන ස්ථානයේ දී
පවත්වන ලද ප්‍රාරම්භක මහා සභා රැස්වීමේ

පිළිගත්

.....පළාතේ
.....දිස්ත්‍රික්කයෙන්
.....මැතිවරණ කොට්ඨාශයේ
..... උප දිසාපති ප්‍රදේශයේ
..... වසමේ
පිහිටි..... ගමේ නගරයේ

සර්වෝදය සමිතියේ රීති මාලාවයි
සහතික කළේ

....

සභාපති ප්‍රධාන ලේකම්

.....

භාණ්ඩාගාරික

සාමාජිකයන් 10 ක්

1. ..... 6. .....
2. ..... 7. .....
3. ..... 8. .....
4. ..... 9. .....
5. ..... 10. .....